ශීර්ෂය 332 - ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 332 - ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 28 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 ජුනි 11 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1 හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනැති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) දේපල පිරියත හා උපකරණ

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයෙහි ප්‍රවාහන උපකරණ ශේෂය තුළ රු.10,700,000 ක් වටිනා වෙනත් ආයතනවලට අයත් මෝටර් වාහන 04 ක් ඇතුළත්ව තිබුණි.	අංක GD-2179, GD-2233 සහ PA-3674 යන කැබ් රථ මෙම දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය වෙත 2024.08.26 දිනැති ලිපිය යොමු කර ඇත. අංක GB-0066 දරන කැබ් රථයද පවරා ගැනීමට කටයුතු සිදු කරනු ලැබේ.	භාවිතා කරනු ලබන වෙනත් ආයතනවල වත්කම් විධිමත් පරිදි පවරාගැනීමට හෝ අදාල ආයතන වෙත නැවත භාරදීමට කටයුතු කල යුතුය.
(ii)	ජල සම්පාදන හා සනීපාරක්ෂාව වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය (WaSSIP) මඟින් දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබූ යතුරු පැදි 53 ක් තක්සේරු කර ගිණුම් ගත කිරිමට කටයුතු කර නොතිබුණි.	මෙම යතුරු පැදි 53 හි අයිතිය අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව නමින් ලියාපදිංචි කර ලැබුණේ 2024 ඔක්තෝම්බර් 14 දිනය. එම යතුරුපැදි 53 හි තක්සේරු වටිනාකම ලබා ගැනීමට කටයුතු සිදු කරනු ලැබේ.	මෙම යතුරුපැදිවල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීම සිදුකල යුතුය.
(iii)	දෙපාර්තමේන්තුවට පවරා ගෙන නොතිබුණු රු.100,000 ක් හා රු.200,000 ක් වටිනා වාහන 02 ක් ස්ථාවර වත්කම් ලේඛණයේ හා මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.	18-5063 හා GC-0258 යන ධාවන තත්වයේ නොපවතින මෙම මෝටර් රථ අපහරණය කිරීමට අයිතිය පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කර, පසුව මු.රෙ 767(1) අනුව කටයුතු සිදු කරනු ලැබේ.	ධාවන තත්වයේ නොපවතින වාහන අයිතිය පවරා ගැනීමෙන් පසු අපහරණය කිරීමට හෝ වාහන අයත් ආයතනවලට ආපසු භාර දීමට කටයුතු කළ යුතුය.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිලිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව	ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය	මෙම වාර්තාවේ ඡේද යොමුව
1.6.1(ආ)	මූල්‍ය ප්‍රකාශනවල මූල්‍ය නොවන වත්කම් පිළිබඳ වාර්තාවෙහි රු.73,207,500 ක් වටිනා ප්‍රවාහන උපකරණ තුල ඇතුලත් රු.10,700,000 ක් වටිනා වෙනත් ආයතනවලට අයත් මෝටර් වාහන 04 ක් විධිමත් පරිදි පවරාගෙන ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කල යුතුය.	1.6.1 (අ)(i)

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 50 ට අනුව සකසුරුවම්කම හා කාර්යක්ෂමතාවය පිළිබඳව අවධානය යොමුනොකර ඇස්තමේන්තු සකස් කිරීම හේතුවෙන් පුනරාවර්තන වැය විෂයන් 01 ක් හා ප්‍රාග්ධන වැය විෂයන් 01 ක් සඳහා වෙන්කර තිබූ රු.2,100,000 ක සම්පූර්ණ ප්‍රතිපාදනය සහ පුනරාවර්තන වැය විෂයන් 09 ක් සඳහා වෙන්කල ප්‍රතිපාදනවලින් රු.6,529,173 ක් හා ප්‍රාග්ධන වැය විෂයන් 02 ක් සඳහා වෙන්කළ ප්‍රතිපාදනවලින් රු.812,161,579 ක් ලෙස සියයට 11 ක සිට සියයට 81 ක් දක්වා ඉතිරි වී තිබුණි.	ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අංක 03/2022 චක්‍රලේඛය අනුව රජයේ වියදම් සීමා කිරීම, වාහන වාර සේවා සිදු නොකිරීම, කාර්යාල ගොඩනැගිලි අලුත්වැඩියා වියදම් නොවීම, පරිගණක සඳහා මෘදුකාංග ඇතුලත් කිරීමේ කටයුතු අවසන් නොවීම, රජයේ ප්‍රතිපත්ති මත විදුලි බිල් හා ජල බිල් ගාස්තු අඩු වීම්, දේපොළ ණය ලබා නොගැනීම, නිලධාරීන් භාෂා දීමනාව සඳහා හිමිකම් නොපෑම වැනි හේතුන් මත ප්‍රතිපාදන ඉතිරිව ඇත.	මුදල් රෙගුලාසි ප්‍රකාරව ප්‍රතිපාදන අවශ්‍යතාවය නිශ්චිතව හඳුනාගෙන ඇස්තමේන්තු පිළියෙල කලයුතු අතර වෙන්කල ප්‍රතිපාදන අදාල අරමුණු සඳහා කාර්යක්ෂමව යෙදවිය යුතුය.

3.2 බැරකම් හා බැදීම්වලට එළඹීම

විගණන නිරීක්ෂණය	ගණකාධිකාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2017 අප්‍රේල් 27 දිනැති මුදල් අමාත්‍යාංශයේ අංක 255/2017 දරණ චක්‍රලේඛයේ (2)(අ), (ආ) සහ 03 වගන්ති ප්‍රකාරව බැදීම් හා බැරකම් හඳුනා ගෙන CIGAS වැඩසටහනට ඇතුළත් කිරීමට පියවර ගත යුතු වුවද විගණන නියැදි පරීක්ෂාවට භාජනය වූ 2025 වර්ෂයේ මුල් මාස දෙක තුළ ගෙවන ලද 2024 වර්ෂයට අදාල රු.12,567,607 ක බැරකම් සම්බන්ධයෙන් එසේ කර නොතිබුණි.	2024 දෙසැම්බර් 31 දිනට බැරකම් නොතිබුණි.	චක්‍රලේඛය ප්‍රකාරව බැදීම් හා බැරකම් හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශ වල දැක්විය යුතුය.

3.3 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

විගණන නිරීක්ෂණය	ගණකාධිකාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
නිවාස හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය සහ ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය විසින් ග්‍රාමීය ජල ව්‍යාපෘති සහ වෙනත් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා 2024 වර්ෂය තුලදී ලබාදී තිබූ එකතුව රු.146,886,750 ක් වූ ප්‍රතිපාදනවලින් රු.39,789,235 ක් එනම් සියයට 27 ක් ලබාදුන් කාර්යයන් වෙනුවෙන් උපයෝජනය කර නොතිබුණි.	මැණික්කඩවර ජල ව්‍යාපෘතියේ ඉදිකිරීම් බිමෙහි සිදුවූ නායයෑම හේතුවෙන් මතුවූ ගැටළු මත ඉදිකිරීම් ප්‍රමාද වීම, වැසි ජල ටැංකි ඉදිකිරීමේ හා වකුගඩු රෝග නිවාරණ වැඩසටහන් යටතේ බිල්පත් ඉදිරිපත් කිරීමට ප්‍රමාණවත් කාලයක් නොමැති වීම, තාක්ෂණික කාර්ය මණ්ඩලයේ පවතින දැඩි හිඟය ප්‍රගතිය අත්කර ගැනීමට බාධාවක් වී ඇත.	අදාල ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ ප්‍රායෝගික ගැටලු පවතින විට ඒ පිළිබඳ අදාල ආයතනවලට පූර්ව දැනුවත් කිරීමක් සිදුකල යුතු අතර වාර්ෂික අයවැය ප්‍රතිපාදන කාර්යක්ෂම ලෙස උපයෝගී කර ගැනීමට කටයුතු කළ යුතුය.

3.4 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයක් ඇති බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 5.1 ඡේදයේ සඳහන් නිරීක්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි.	දෙපාර්තමේන්තුව සඳහා ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයකු ලබා ගැනීමට අදාළව ඉල්ලීම අංක DNCWS/ADM/05/01/VOL-ii හා 2025 අප්‍රේල් 03 දිනැති ලිපිය ලේකම්, නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය මඟින් අධ්‍යක්ෂ ජනරාල්, කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.

3.5 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

	නිරීක්ෂණය			ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
	නීති,රීති හා රෙගුලාසි වලට යොමුව	වටිනාකම (රු.)	අනුකූල නොවීම		
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ අංක 137 දරන මුදල් රෙගුලාසිය.	9,862,045	මුදල් රෙගුලාසි ප්‍රකාරව භාණ්ඩ නිවැරදි ලෙස භාරගෙන තිබෙන බවට තහවුරුකර ගැනීමකින් තොරව මුද්‍රණ යන්ත්‍ර 20 ක් සඳහා 2024 දෙසැම්බර් 31 දින අංක 133619 දරණ චෙක්පත මගින් ගෙවීම් කර තිබූ අතර එම භාණ්ඩ 2025 ජූලි 31 දින වන විටත් දෙපාර්තමේන්තුවට ලැබී නොතිබුණි.	ඇණවුම් කල යන්ත්‍ර කිහිපයක් පිරිවිතර හා නොගැලපුන බැවින් චෙක්පත් නිකුත් නොකරන ලදී. අදාල යන්ත්‍ර නිවැරදිව භාරදෙන ලෙස දැනුම්දී ඇත.	ඇණවුම් කල භාණ්ඩ නියමිත පරිදි ලැබී ඇති බවට තහවුරු කර ගත යුතුය. මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු නොකල නිලධාරීන් සඳහා විනය ක්‍රියාමාර්ග ගත යුතුය.

(ආ)	2006 - රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8 හා 8.9.3 ඡේද	ඉහත කී භාණ්ඩ මිලදී ගැනීමේදී සැපයුම්කරු සමග ගිවිසුමකට එළඹ නොතිබූ බැවින් භාණ්ඩ සැපයිය යුතු දිනයන් පිළිබඳව එකගතාවයන් නොතිබුණු අතර ඊට අදාල කාර්යසාධන සුරක්ෂණයන් ලබාගැනීමටද කටයුතු කර නොතිබුණි. ඒ අනුව එම භාණ්ඩ නියමිත කාලය තුල නොසැපයීමෙන් ආයතනයට වන හානිය ආවරණය කරගැනීමට නොහැකි වී තිබුණි.	භාණ්ඩ ඇණවුම් කිරීම, ගෙවීම් කිරීම 2024/12/31 දිනට ප්‍රථමව සිදු කල යුතුව තිබූ බැවින් ගිවිසුම් ගතවීම සිදුකර නොමැත.	රජයේ ප්‍රසම්පාදන නීති රීති ප්‍රකාරව කටයුතු නොකළ නිලධාරීන් සඳහා විනය ක්‍රියාමාර්ග ගත යුතුය.
(ඇ)	ප්‍රසම්පාදන අත්පොතේ 7.9.2(ක) ඡේදය	කොන්ත්‍රාත් වටිනාකම හා ඉංජිනේරු ඇස්තමේන්තුව අතර සැලකියයුතු වෙනසක් පවතින විට ඉංජිනේරු ඇස්තමේන්තුව සමාලෝචනය කලයුතු වුවත් මැණික්කඩවර ව්‍යාපෘතියට අදාලව ලංසුකරු විසින් ඉංජිනේරු ඇස්තමේන්තුවේ සඳහන් රේටයන්ට වඩා සියයට 43 සිට සියයට 87 දක්වා අඩු මිල ගණන්ද සියයට 51 සිට සියයට 211 දක්වා වැඩි මිල ගණන්ද ඉදිරිපත් කර තිබූ අතර එම විෂමතාවයන්ට හේතු විශ්ලේෂණය නොකර සහ විධිමත් පරිදි ලංසු ඇගයීමකින් තොරව කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි.	පිළිතුරු ලබා දී නැත.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව ලංසු ඇගයීම සිදුකල යුතුය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 දැක්ම හා මෙහෙවර

විගණන නිරීක්ෂණය	ගණකාධිකාරී/ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව ස්ථාපිත කිරීම සඳහා වූ පනත් කෙටුම්පත සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාදී වර්ෂ 10 ක් ගත වී තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අදාල පනත සම්මත කර ගැනීමට කටයුතු කර නොතිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව ආරම්භ කිරීමට අදාල කැබිනට් පත්‍රිකාවේ සඳහන් කාර්යයන් සිදුකිරීමට දෙපාර්තමේන්තුවට නෛතික පසුබිමක් නොතිබුණි.	අදාළ පනත් කෙටුම්පත 2025 මැයි 08 දින ලේකම්, නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. තවද මෙම පනත සකස් කිරීම සඳහා විද්වත් කමිටුවක් පත් කිරීමටද යෝජනා කර ඇත.	පනත සම්මත කරගැනීම කඩිනම් කර දෙපාර්තමේන්තුවේ කාර්යයන් විධිමත්ව පවත්වාගෙනයාමට අවශ්‍ය නෛතික පසුබිම සකසාගත යුතුය.

4.2 කාර්යභාරයන් ඉටුනොකිරීම

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2014 ජුලි මස 11 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව 2024 දෙසැම්බර් 31 වන විට එහි ප්‍රධාන අරමුණ වූ ග්‍රාමීය ප්‍රජාව වෙත පිරිසිදු පානීය ජලය සැපයීම සඳහා ප්‍රජා මූල සංවිධාන 4442 ක් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර තිබූ අතර අදාළ ප්‍රජා මූල සංවිධාන නියාමනය ප්‍රධාන කාර්යාලයෙන් හා ඒ යටතේ ඇති දිස්ත්‍රික්ක කාර්යාල 25 ක් මගින් සිදුකර තිබුණද එම කටයුත්ත අපේක්ෂිත පරිදි ඉටුකිරීමට දෙපාර්තමේන්තුවට නොහැකි වී තිබුණි. තවද දෙපාර්තමේන්තුව ආරම්භකර වර්ෂ 10 ක් ඉක්ම ගොස් ඇතත් දෙපාර්තමේන්තුවෙහි ප්‍රධාන කාර්යයන් ලෙස හඳුනාගෙන ඇති ග්‍රාමීය ජල සම්පාදන හා සනීපාරක්ෂක ක්ෂේත්‍රයට අදාල සියළු රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවල සහාය ඇතිව ජාතික ප්‍රතිපත්ති සකස් කිරීම හා යාවත්කාලින	ප්‍රජා මූල සංවිධාන නියාමනය කිරීම ප්‍රධාන කාර්යාලයෙන් හා දිස්ත්‍රික් කාර්යාල මගින් සිදු කරනු ලබයි. ග්‍රාමීය ජල සම්පාදන හා සනීපාරක්ෂක ක්ෂේත්‍රයට අදාල ජාතික ප්‍රතිපත්ති සකස් කිරීම සිදුකරමින් පවතින අතර ජලයෙහි ගුණාත්මකභාවය පරීක්ෂා කිරීම ජල ආරක්ෂණ ප්‍රතිපත්තියට අනුව නීතිමය අවශ්‍යතාවයක් බව හඳුන්වා දී ඇති අතර එම කටයුතු බොහෝ දිස්ත්‍රික්කවල ආරම්භ කර ඇත.	ප්‍රජාමූල සංවිධාන නිසිපරිදි අධීක්ෂණය හා නියාමනය කර ජනතාවට පිරිසිදු පානීය ජලය සැපයීමට කටයුතු කලයුතු අතර ජල සම්පාදන හා සනීපාරක්ෂක ක්ෂේත්‍රයට අදාලව ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම කඩිනම් කලයුතුය.

	කිරීම මෙන්ම ජල යෝජනා ක්‍රමයන්ට ලබාගන්නා ජලයෙහි ගුණාත්මකභාවය පරීක්ෂා කිරීම සඳහා විධිමත් වැඩපිළිවෙලක් දෙපාර්තමේන්තුව තුල නොතිබුණි.		

4.3 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව මගින් පුත්තලම දිස්ත්‍රික්කයේ ජල ව්‍යාපෘති 04 ක් සඳහා ජලය පිරිපහදු කිරිමේ මධ්‍යස්ථාන 04 ක් ඉදිකර පිරිපහදු යන්ත්‍ර (Package Plant) සපයා සවිකිරිම සඳහා පෞද්ගලික ආයතනයක් වෙත 2022 මාර්තු 24 වන විට රු.16,383,889 ක් ගෙවා තිබුණි. මෙම පිරිපහදු යන්ත්‍ර මගින් ලබාදෙන ජලයේ ගුණාත්මකබව පිලිබඳ පාරිභෝගික විශ්වාසය නොමැතිවීම, එම ව්‍යාපෘති ආසන්නයේම නැනෝ පිරිපහදු ව්‍යාපෘති පැවතිම වැනි හේතුන් මත ජල ඉල්ලුම අඩුවී විගණිත දින වූ 2024 අගොස්තු 29 දින වනවිට මෙම යන්ත්‍ර ක්‍රියාත්මක තත්ත්වයේ නොමැති වීමෙන් වැයකරන ලද සම්පූර්ණ මුදල නිශ්කාර්ය වී තිබුණි.	මෙම ව්‍යාපෘති 04 හි වැඩ අවසන් කර අවසන් බිල්පත් ගෙවීම් කරන අවස්ථාවේදී මෙම යන්ත්‍ර ක්‍රියාත්මක තත්ත්වයේ පැවතුණි. ප්‍රජා මූල සංවිධානයේ ප්‍රජාවගේ මතභේදාත්මක කරුණු මත පිරිපහදු පද්ධතිය භාවිතය නතර වී ඇත. ප්‍රජාව සමඟ සාකච්ඡා කර විසඳුමක් ලබා දෙන ලෙස නිලධාරීන් දැනුවත් කරන ලදී.	මෙම ව්‍යාපෘතිය අසාර්ථක වීම සඳහා නොසැළකිලිමත් කමින් කටයුතු කරන ලද නිලධාරීන් සම්බන්ධයෙන් අවශ්‍ය විනය ක්‍රියාමාර්ග ගත යුතු අතර ව්‍යාපෘතිය නැවත ක්‍රියාකාරී තත්ත්වයට පත්කර ගැනීමට හෝ වෙනත් සුදුසු ස්ථානවල ජල පිරිපහදු යන්ත්‍ර ස්ථාපිත කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය.
(ආ)	පුත්තලම දිස්ත්‍රික්කය තුළ විගණන නියැදි පරීක්ෂාවට භාජනය වූ ප්‍රජා ජල අභිමානි ව්‍යාපෘති 56 කින් ව්‍යාපෘති 24 කට අදාලව කාලීනව ජලතත්ත්ව පරීක්ෂණ වාර්තා ලබාගෙන නොතිබුණි.	ප්‍රජා ජල සම්පාදන ක්‍රම අතරින් විශාල ප්‍රමාණයක ජල තත්ත්ව පරීක්ෂා කර නොතිබුණි. එම පරීක්ෂා සිදුකිරීම ජල ආරක්ෂණ ප්‍රතිපත්තියට අදාළව නීතිමය අවශ්‍යතාවයක් බව සියළුම දිස්ත්‍රික්ක වෙත පෙන්වා දෙන ලදී. ඒ අනුව බොහෝ දිස්ත්‍රික්කවල මෙම කටයුත්ත ආරම්භ කර ඇති අතර, එම තොරතුරු කළමනාකරණ	කාලීනව ජලතත්ත්ව පරීක්ෂණ පවත්වා ජනතාවට පිරිසිදු පානිය ජලය ලබාදිමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.

	පද්ධතියට ඇතුල් කරන ලෙස නිලධාරීන් දැනුවත් කරන ලදී.	
(ඈ) දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරනු ලබන සනීපාරක්ෂක පහසුකම් ලබාදීමේ ව්‍යාපෘතිය මගින් 2020-2022 වර්ෂ තුළදී පුත්තලම දිස්ත්‍රික්කයේ ප්‍රතිලාභී පවුල් 120 ක් සඳහා රු.40,000 බැගින් රු.4,800,000 ක් ගෙවා තිබුණි. නිසි අධීක්ෂණයක් යටතේ එම කටයුත්ත සිදු නොකිරීම හේතුවෙන් අදාළ ඉදිකිරීම් 2024 අගෝස්තු වන විටත් අවසන් නොකර පැවතීමෙන් ගෙවන ලද මුදල් නිශ්කාර්ය වී පැවතිණි.	ඉදිකිරීම් අවසන් නොකළ ප්‍රතිලාභීන්ගෙන් මුදල් අයකර ගැනීමට දිස්ත්‍රික් ස්ථානභාර නිලධාරී විසින් අදාළ කටයුතු සිදුකරමින් පවතී.	මෙම වැඩසටහන නිසි අධීක්ෂණයක් යටතේ ක්‍රියාත්මක කර ජනතාවට අදාල සේවාව ලබාදිය යුතු අතර මෙම වැඩසටහන නිසි අධීක්ෂණයක් යටතේ ක්‍රියාත්මක නොකිරීමට වගකිව යුතු නිළධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගතයුතුය.

4.4 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

විගණන නිරීක්ෂණය	**ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
එකතුව රු.43,277,707 ක මුදලක් වැය කර ඉදිකරමින් පැවති පුත්තලම දිස්ත්‍රික්කයේ මාදම්පේ හේනේපොළ නිල්දිය දහර ව්‍යාපෘතිය, කරුවලගස්වැව ගැමි සරණ ව්‍යාපෘතිය, නාත්තණ්ඩිය සියශක්ති ප්‍රජා ජල ව්‍යාපෘතිය යන ව්‍යාපෘතිවල කටයුතු විවිධ හේතු මත අතර මඟ නැවතී තිබුණි.	පුත්තලම, මාදම්පේ හේනේපොල නිල්දියදහර ප්‍රජා ජල ව්‍යාපෘතියේ ඉදිකිරීම් අවසන් අදියරේ ඇති බැවින් හා කරුවලගස්වැව ගැමි සරණ ප්‍රජා මූල සංවිධානය සහ නාත්තණ්ඩිය සිය ශක්ති ප්‍රජා මූල සංවිධානයන් සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය මගින් මාර්ග සඳහා අවසර ගෙන ඇති බැවින්, 2025 වර්ෂය තුළ ව්‍යාපෘතිවල සියළු වැඩ අවසන් කිරීමට නියමිතය.	මෙම ව්‍යාපෘති කඩිනමින් නිමකර ජනතාව වෙත ජලය ලබාදීමට අවශ්‍ය පියවර ගත යුතුය.

4.5 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

විගණන නිරීක්ෂණය	**ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(අ) ප්‍රජා ජල අභිමානි වැඩසටහන යටතේ 2020-2021 වර්ෂවල ඉදිකිරීම් ආරම්භ කරන ලද ව්‍යාපෘතින් 244 න් 205 ක්ද 2019-2020 වර්ෂයේ ඉදිකිරීම් ආරම්භ	2020, 2021, 2022 වර්ෂයන්හි රට තුළ ඇතිවූ කොරෝනා වසංගතය, ආර්ථික අර්බුධය, ඉන්ධන හිඟය යන කරුණු හේතුවෙන් ඉදිකිරීම් කටයුතු	වැය කර ඇති රජයේ මුදල් වලින් උපරිම ප්‍රතිලාභ ලැබෙන පරිදි මෙම ව්‍යාපෘති කඩිනමින් නිමකර ජනතාවට පිරිසිදු

	කළ ව්‍යාපෘතින් 05 ක්ද විවිධ හේතූන් මත 2024 දෙසැම්බර් 31 වන විටත් අවසන් වී නොතිබූ අතර ඒ සඳහා රු.1,754,058,041 ක මුදලක් වැය කර තිබුණි. ව්‍යාපෘති ආරම්භ කර වසර 5 ක් ඉක්ම ගොස් තිබුණද මෙම ව්‍යාපෘති අවසන් කර ජනතාවට ජලය ලබාදීමට අපොහොසත් වීමෙන් ඒ වෙනුවෙන් වැය කළ මුදල් නිෂ්කාර්යය වී තිබුණි.	වල ප්‍රමාදයන් සිදුවිය. මෙම සියළු ව්‍යාපෘති සම්බන්ධව නැවත අධ්‍යනයක් කර 2027 වර්ෂය වන විට ඉදිකිරීම් නිම කිරීමට සැලසුම් කර ඇති අතර, ප්‍රමුඛතා ලේඛනයක් සකස් කර 2025 වර්ෂයේ ක්‍රියාත්මක සැලැස්ම තුළ ඇතුළත් කර ඇත.	පානිය ජලය ලබා දීමට අවශ්‍ය පියවර ගත යුතුය.
(ආ)	කෑගල්ල දිස්ත්‍රික්කයේ මැණික්කඩවර හා මහ පල්ලේගම ගම්මානවල පවුල් 800 ක ජනතාවට පිරිසිදු පානීය ජලය ලබාදීමේ අරමුණින් 2019 වර්ෂයේ ආරම්භ කර තිබූ ජල ව්‍යාපෘතියෙහි රු.68,097,803 ක්වූ මුල් ඇස්තමේන්තුව 2023 වර්ෂය වන විට රු.120,500,000 ක් ලෙස සංශෝධනය කර තිබූ අතර ඒ වන විට ඉදිකිරීම් සහ ජලනල හා උපාංග මිලදී ගැනීම වෙනුවෙන් රු.32,863,884 ක් වැය කර තිබුණි. මෙහිදී නායයාමට ලක්වීමෙන් ආරක්ෂාවීම සඳහා රු.2,031,924 ක් වැයකර ඉදිකර තිබූ පැතිබැම්ම ප්‍රමාණවත් නොවීම මත භූ විද්‍යා හා පතල් කාර්යාංශයේ නිර්දේශ අනුව රු.25,113,347 ක ඇස්තමේන්තු පිරිවැයක් මත පැති බැම්මක් ඉදිකිරීම සඳහා නව කොන්ත්‍රාත්කරුවකු තෝරාගෙන තිබුණි. එසේම රු.1,459,604 ක් වැයකර ඉදිකර තිබූ ළිඳෙහි ජලය ප්‍රමාණවත් නොවීම මත එය භාවිතයට ගෙන නොතිබූ අතර ජල පිරිපහදු මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා භූමිය හා මාර්ගය ඉදිකිරීම වෙනුවෙන් (Site Work) රු.917,345 ක් ගෙවීම්කර තිබුණද	ඉදිකිරීම් භූමියේ ඇතිවූ නායයෑම හේතුවෙන් ඉදිකිරීම් තාවකාලිකව නවතා ඇති නිසා උපකරණ සවිකිරීම හා නල එලීම් කටයුතු සිදු කර නැත. ලබා දී ඇති උපකරණ සවිකරන තෙක් සිසිලස ප්‍රජා මූල සංවිධානයේ විධිමත්ව ගබඩා කර තබන ලෙස දැනුවත් කර ඇත. පිරිපහදු මධ්‍යස්ථාන භූමිය හා පිරිපහදු මධ්‍යස්ථානයට යන මාර්ගය ඉදිකිරීම සඳහා රු.917,345 ගෙවා ඇත. කෙසේ වුවද මෙම ව්‍යාපෘතිය කඩිනමින් ඉදිකිරීම් අවසන් කිරීමට කටයුතු කරමින් පවතී.	මෙම ව්‍යාපෘතිය කඩිනමින් නිම කර ජනතාවට පිරිසිදු පානීය ජලය සැපයිය යුතු අතර එහි කටයුතු විධිමත් පරිදි සැළසුම්කර ක්‍රියාත්මක නොකර රජයේ මුදල් අනාර්ථික ලෙස වැය කිරීමට කටයුතු කල නිළධාරීන් සම්බන්ධයෙන් අවශ්‍ය විනය ක්‍රියාමාර්ග ගත යුතුය.

2025 මාර්තු වන විටත් පිරිපහදු මධ්‍යස්ථානයක් ඉදිකර නෙොතිබුණි. මහපල්ලේගම ගම්මානය සඳහා ඉදිකර තිබූ නල ළිඳකින් ජලය ලබාගෙන පොම්පාගාරය හා ජලය බෙදා හැරීමේ පද්ධතියක් ඉදිකිරීම් සඳහා රු.40,304,273 ක කොන්ත්‍රාත්තුව 2024 වර්ෂයේ ජූලි 24 දින පුද්ගලික ආයතනයක් වෙත පිරිනමා තිබුණි. මෙම කොන්ත්‍රාත්තුව 2024 නොවැම්බර් 01 දින අවසන් කල යුතු වුවත් 2024 දෙසැම්බර් 31 වන විට රු.17,718,047 ක මුදලක් වැයකර තිබුණද වැඩ අවසන් වී නොතිබුණි.
2024 දෙසැම්බර් 31 වන විට මෙම ව්‍යාපෘතිය ආරම්භ කර වර්ෂ 05 ක් ඉක්මගොස් හා එකතුව රු.50,581,931 ක් වැයකර තිබුණද කිසිදු පාරිභෝගිකයෙකුට ජලය ලබාදිමට අපොහොසත් වී තිබුණි.

4.6 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
වකුගඩු රෝගයෙන් පීඩා විදින ජනතාව වෙනුවෙන් දිස්ත්‍රික්ක 11 ක නැනෝ පිරිපහදු යන්ත්‍ර 140 ක් රු.400,393,519 ක් වූ කොන්ත්‍රාත් වටිනාකමට මාස 10 ක් තුළ සවි කිරීම සඳහා 2021 වර්ෂයේ පෞද්ගලික ආයතනයකට කොන්ත්‍රාත් පිරිනමා තිබුණි. දිස්ත්‍රික්ක 04 ක ප්‍රතිලාභීන් 5414 ක් සඳහා ස්ථාපනය කරන ලද පිරිවැය රු.47,372,019 ක්වූ නැනෝ පිරිපහදු යන්ත්‍ර 18 ක් 2025 පෙබරවාරි වන විට ක්‍රියාත්මක තත්ත්වයේ නොතිබු අතර දිස්ත්‍රික්ක 04 ක ප්‍රතිලාභීන් 25,497 කට රු.183,451,853 ක් වැයකර ස්ථාපනය කරන ලද නැනෝ පිරිපහදු යන්ත්‍ර 54	මෙම කොන්ත්‍රාත් මඟින් පුත්තලම දිස්ත්‍රික්කයේ ඉදිකරන ලද නැනෝ පිරිපහදු යන්ත්‍ර සියල්ලම මේ වන විට ජලය සම්පාදනය කරයි. කුරුණෑගල, මොණරාගල හා අනුරාධපුර යන දිස්ත්‍රික්කවල යෝජිත ව්‍යාපෘති 42 කින් 19 ක් ක්‍රියාකාරී අතර, 14 ක් ඉදිකිරීම් මට්ටමේ පවතියි. අනෙක් ව්‍යාපෘති 09 හි ඉදිකිරීම් නැවැත්වීමට තීරණය කර ඇත. පිරිපහදු කළ ජලය භාවිතා කිරීම පිළිබඳව සෞඛ්‍ය අංශ සම්බන්ධ කර ගනිමින් ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමට	ඉදි කරන ලද සියළුම නැනෝ පිරිපහදු යන්ත්‍ර ප්‍රයෝජනයට ගැනිමට හා ඉලක්කගත කළ ප්‍රතිලාභීන්ට ජලය ලබා දිමට ක්‍රියාමාර්ග ගත යුතුය. යන්ත්‍ර ආරක්ෂාකාරිව නඩත්තු කරමින් පවත්වාගෙන යාම නිලධාරින්ගේ වගකීම බැවින් ඒ අනුව කටයුතු කල යුතුය.

කින් ජලය සැපයීමට හැකි වී තිබුණේ ප්‍රතිලාභීන් 3835 කට පමණි. 2025 පෙබරවාරි වන විටත් ප්‍රතිලාභීන් 7310 කට ජලය සැපයීමට සැලසුම් කළ පිරිපහදු යන්ත්‍ර 22 ක් ස්ථාපනය කර නොතිබුණි. කිලිනොච්චිය, වව්නියාව, මුලතිව් යන දිස්ත්‍රික්කවල රු.193,898,520 ක්වූ නැනෝ පිරිපහදු යන්ත්‍ර 50 ක් ස්ථාපනය කිරීමට සැලසුම් කර තිබුණද 2024 වර්ෂයේ නොවැම්බර් මස වන විට ගෙවූ අවසන් බිල්පත අනුව කල වැඩ වටිනාකම රු.174,274,077 ක් වී තිබුණි. ඒ අනුව ගිවිසුම්ගත කාර්යන්ගෙන් රු.19,619,443 ක වැඩ කොටස් ඉටුකර නොතිබුණි. මෙම යන්ත්‍ර සවිකිරිම අනුමත ප්‍රමිතියට අනුව සිදු කර නොතිබුණු බව විගණන නියදි පරීක්ෂණවලදී අනාවරණය වී තිබුණු අතර විදුලි උපාංග සවි නොකර තිබියදී හා ස්ථාන කිහිපයක ජල මෝටර් හා පොම්ප නොතිබියදී ඉංජිනේරුවරයා හා තාක්ෂණික නිලධාරි විසින් වැඩ නිම කල බවට ලබාදුන් සහතික මත ගෙවීම් කර තිබුණි.	සැලසුම් කර ඇත. වවුනියාව සැළලිහිනිගම ඉදිකරන ලද ජල පිරිපහදු යන්ත්‍රයේ පොම්පය අස්ථානගත වීම සම්බන්ධයෙන් පොලිසියට පැමිණිලි කර ඇත. මෙම පිරිපහදු මධ්‍යස්ථාන සඳහා ස්ථාන තෝරා ගැනීමට නාගරික සංවර්ධන, ඉදිකිරීම් හා නිවාස අමාත්‍යාංශයේ, ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් නිලධාරීන් හා දේශපාලන අධිකාරිය සම්බන්ධ විය. මෙම ව්‍යාපෘති ජනතා අයිතියට පත්කරන අවස්ථාව වන විටත්, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් මෙම ප්‍රදේශය ආවරණය කර නොතිබු අතර පසුව, ජල සම්පාදන මණ්ඩලය විසින් ජලය ලබාදී ඇත.	

4.7 ප්‍රසම්පාදනයන්

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
කළුතර, බුලත්සිංහල උතුර නාගරික සංවර්ධන පදනම ජල ව්‍යාපෘතිය වෙත රු.35,376,959 ක් වටිනා GI බට හා උපාංග 2024 මාර්තු 15 දින පෞද්ගලික ආයතනයකින් මිලදී ගෙන තිබුණි. ලංසුකරු ඉදිරිපත්කර තිබූ ඇස්තමේන්තුව ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා රු.6,496,371 ක් එනම් සියයට 17.39 කින් වැඩි වී තිබූ අතර ඒ සම්බන්ධයෙන් ප්‍රසම්පාදන අත්පොතේ 7.9.2(ක) ප්‍රකාරව විෂමතාවයට හේතු විශ්ලේෂණය කර නොතිබුණි. මෙම ජලනල එළීමේ කටයුතු ප්‍රජා මූල සංවිධානය විසින් සිදුකර තිබූ අතර එම කටයුතු 2024 මැයි	GI බට හා උපාංග මිලදීගැනීමේ කොන්ත්‍රාත්තුව ABC Trade & Investment (Pvt) Ltd ආයතනයට ලබා දී ඇති අතර, එහි ඉංජිනේරු ඇස්තමේන්තු මුදලට වඩා කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත්කර ඇති මිල වැඩි අයිතම ඉංජිනේරු ඇස්තමේන්තු මුදලටම සිදුකිරීම අපහසු බැවින් මුළු ලංසු මුදලෙන් රු.400,000 මුදලක් අඩු කර ඇත.	ප්‍රසම්පාදන කටයුතු සඳහා වැයකරනු ලබන රජයේ මුදල්වලින් උපරිම ප්‍රතිලාභ ලැබෙන පරිදි ව්‍යාපෘතිය නිම කිරිමට කටයුතු කළ යුතුය.

16 දින වනවිට අවසන් කල යුතු වුවත් විගණිත දිනය වූ 2025 ජනවාරි වන විටත් අවසන් වී නොතිබුණි.

4.8 වත්කම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ප්‍රජා ජල අභිමානි වැඩසටහන යටතේ පුත්තලම දිස්ත්‍රික්කයේ ඉදිකිරීම් කර තිබූ ප්‍රජා ජල ව්‍යාපෘති 07 ක් 2024 ඔක්තෝම්බර් වනවිටත් ක්‍රියාත්මක නොවීම හේතුවෙන් 2023 දෙසැම්බර් මස එම ව්‍යාපෘති සඳහා ලබා දී තිබූ රු.23,492,999 ක් වටිනා PVC ජලනල හා රු.10,112,025 ක් වටිනා වතුර මීටර් නිවෙස්වල, විහාරස්ථානවල හා පොදු ස්ථානවල අනාරක්ෂිතව ගොඩ ගසා තිබූ අතර ඒ පිළිබඳ දෙපාර්තුමේන්තුව දැනුවත්කර තිබුණද, ඒ පිළිබඳව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.	පුත්තලම දිස්ත්‍රික්කයේ ව්‍යාපෘති 05ක ඉදිකිරීම් වැඩ මේ වන විට අවසන් අදියරේ පවතින අතර නාත්තණ්ඩිය, තුම්මෝදර, සිය ශක්ති ප්‍රජා මූල සංවිධානය හා මහවැව, කල්මුල්ල එක්සත් ප්‍රජා මූල සංවිධානය ව්‍යාපෘතීන්හි ඇස්තමේන්තු සකස් කර ඇති අතර ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමට නියමිතය.	රජයේ මුදල් වැයකර අවශ්‍යතාවයට පෙර මිලදීගැනීම් සිදුකර උපකරණ විනාශවීමට ඉඩහැරීමට සම්බන්ධ නිලධාරීන්ට එරෙහිව අවශ්‍ය විනය ක්‍රියාමාර්ග ගතයුතු අතර ප්‍රජා ජල ව්‍යාපෘති නිම කිරිම කඩිනම් කළ යුතුය.
(ආ)	මැණික්කඩවර සිසලස පානීය ජල ව්‍යාපෘතිය සඳහා මිලදීගෙන තිබූ රු.4,315,000 ක් වූ ජල පොම්ප හා උපාංගද රු.4,290,300 ක් වූ ජලමනු 945 ක්ද වසර 02 ට ආසන්න කාලයක සිට ප්‍රයෝජනයට නොගෙන ගබඩා කර තිබුණි. එමෙන්ම 2020 ඔක්තෝම්බර් මස රු.9,110,151 ක් වැයකර මිලට ගෙන තිබූ ජලනල හා උපාංග වලින් විශාල ප්‍රමාණයක්ද 2024 දෙසැම්බර් 31 දක්වා ප්‍රයෝජනයට නොගෙන අනාරක්ෂිත ස්ථානවල ගබඩා කර තිබූ අතර ඒවා විනාශයට පත්වෙමින් තිබුණි.	මෙම ව්‍යාපෘතිය සඳහා සපයා තිබූ පොම්ප වෙනත් සුදුසු ප්‍රජා සංවිධානයක් වෙත ලබා දීමට කටයුතු කරන බවත්, සපයා තිබූ ජල නළ ආරක්ෂිත ස්ථානයක ගබඩා කිරීමට ප්‍රජා මූල සංවිධානය දැනුවත් කර ඇත.	රජයේ මුදල් වැයකර අවශ්‍යතාවයට පෙර මිලදීගැනීම් සිදුකර උපකරණ විනාශවීමට ඉඩහැරීමට සම්බන්ධ නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගතයුතු අතර භාවිතයට ගත හැකිව පවතින උපාංග ප්‍රයෝජනයට ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය.

(ඇ)	2023 දෙසැම්බර් මස දිස්ත්‍රික්ක 07 ක ප්‍රජා මූල සංවිධාන 08 ක් වෙත ලබා දී තිබූ ජල මීටර් 1208 කින් රු.9,267,055 ක් වටිනා ජල මීටර් 908 ක් 2025 මාර්තු 31 දින වන විටත් භාවිතයට ගෙන නොතිබුණි. ව්‍යාපෘති වැඩ අවසන් වූ පසු අවශ්‍ය වන මෙම උපාංග අවශ්‍යතාවය නොසලකා මිලදී ගෙන තිබුණ අතර ඒ සඳහා ලබා දී තිබූ වගකීම් කාලයන්ද ඉක්මවා ගොස් තිබුණි.	ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතුවල ප්‍රමාදය, ප්‍රතිලාභීන් විසින් ජල සම්බන්ධතා ගාස්තු නොගෙවීම, පාරිසරික ගැටළු හේතුවෙන් ව්‍යාපෘතියේ වැඩ නතර වී තිබීම වැනි හේතූන් මත ජල මීටර් සවිකිරීම ප්‍රමාද වී ඇති අතර භාවිතා නොවන ජල මීටර් දිස්ත්‍රික්කයේ වෙනත් අවශ්‍යතා ඇති සමිති වෙත ලබා දෙන ලෙස නිලධාරීන් දැනුවත් කරන ලදී.	අවශ්‍යතාවය නොසලකා මිලදීගැනීම් සිදුකර උපකරණ විනාශවීමට ඉඩහැරීම සහ රජයේ මුදල් නොසැලකිලිමත් ලෙස පරිහරණය කිරීම සම්බන්ධ වගකිවයුතු නිලධාරීන්ට එරෙහිව අවශ්‍ය විනය ක්‍රියාමාර්ග ගතයුතු අතර පවතින ජල මීටර් තොගය භාවිතයට ගැනීම කළ යුතුය.
(ඇ)	ජල සම්පාදන හා සනීපාරක්ෂක සේවා ව්‍යාපෘතිය මගින් ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව වෙත ලබාදී තිබූ ජංගම ජල පරීක්ෂණ රථය 2024 සැප්තැම්බර් 27 දින සිට කිසිදු පරීක්ෂණ කටයුත්තක් සඳහා යොදා නොගෙන ලක්දිය මැදුර පරිශ්‍රයේ නවතා තිබුණි.	ජල පරීක්ෂණ කටයුතු සඳහා අවශ්‍ය නිලධාරීන් නොමැති බැවින් මෙම රථය භාවිතයට නොගනියි.	ජල පරීක්ෂණ රථය විනාශ වීමට ඉඩ නොහැර භාවිතයට ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.

4.9 පාඩු හා හානි

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
ගාල්ල ඉමදුව සවිය ජල ව්‍යාපෘතිය වෙනුවෙන් ලද රු.251,163 ක් ගාල්ල දිස්ත්‍රික් ස්ථානභාර නිලධාරිගේ පෞද්ගලික ඉතුරුම් ගිණුමට බැර කර ගෙන තිබුණි. මෙම අයථා පරිහරණය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 156 හා ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVII වැනි පරිච්ඡේදයේ 5.3 ප්‍රකාරව කටයුතු කළ යුතු වුවත් එසේ කර නොතිබුණි.	මේ සම්බන්ධයෙන් විමර්ශණයක් පවත්වා විමර්ශණ වාර්තාව ලබාගෙන ඇත. ඒ අනුව ඉදිරි කටයුතු සිදුකිරීමට නියමිතය.	මේ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 156 හා ආයතන සංග්‍රහයේ අදාල විධිවිධාන ප්‍රකාරව කටයුතු කලයුතුය.

4.10 කළමනාකරණ දූර්වලතා

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කර තිබූ ප්‍රජා ජල ව්‍යාපෘති සම්බන්ධයෙන් 2021-2024 වර්ෂයන්වලදී සිදුකල නියැදි විගණන පරීක්ෂාවන්වලදී ජල ව්‍යාපෘති ඉදිකිරීමේ කොන්ත්‍රාත්වල ඉටු නොකරන ලද කාර්යයන් සඳහා වැඩිපුර ගෙවීම් සිදුකල අවස්ථා 23 ක් සඳහා රු.20,338,157 ක් ගෙවා ඇති බව අනාවරණය වී තිබුණි. එම අනාවරණයන්ට අදාලව මූලික පරීක්ෂණ පවත්වා නිර්දේශ ක්‍රියාත්මක කිරීමේදී දෙපාර්තමේන්තුව මගින් මාර්ගෝපදේශ චක්‍රලේඛ මගින් නිරන්තරයෙන්, හඳුන්වා දී තිබූ කරුණු පිලිබඳව සැලකිලිමත් වන ලෙස උපදෙස් හා තරයේ අවවාද කිරීමේ ලිපි පමණක් අදාල නිලධාරීන්ට නිකුත් කර තිබූ අතර ඒ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 156 ප්‍රකාරව හා පාඩු සිදුකල නිලධාරින්ට එරෙහිව ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදය ප්‍රකාරව විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි.	පිළිතුරු ලබා දී නැත	විගණනයෙන් පෙන්වා දී ඇති කරුණු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි හා ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කර රජයට සිදුවූ පාඩු ආවරණයකර ගැනිමට කටයුතු කල යුතු අතර මුදල් රෙගුලාසි 128 ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ අකාර්යක්ෂම මූල්‍ය පාලනය සම්බන්ධයෙන් ආයතන ප්‍රධානියා වගකිව යුතුය.
(ආ)	2022 මැයි 22 දිනැති අංක 22/0508/414/003 දරණ අමාත්‍ය මණ්ඩල තීරණය හා 2022 අප්‍රේල් 26 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 03/2022 පාදක කර ගනිමින් දෙපාර්තමේන්තුව විසින් 2021 හා 2023 වර්ෂයන් තුළදි ලබාදී තිබූ රු.301,565,687 ක ජල ව්‍යාපෘති ඉදිකිරීමේ කොන්ත්‍රාත් 31 ක් අන්‍යොන්‍ය එකඟතාවය මත අවසන් කර තිබූ අතර ඒවායේ කළ වැඩ	පිළිතුරු ලබා දී නැත	සැලසුමකින් හා ශක්‍යතාවයකින් තොරව ව්‍යාපෘති ආරම්භකර රජයේ මුදල් නිශ්කාර්ය වීමට ඉඩහැර පාඩු සිදුකිරීමට අදාල නිලධාරීන්ට විරුද්ධව විනයානුකූලව කටයුතුකල යුතු අතර මෙම ව්‍යාපෘතිය නිසි පරිදි ක්‍රියාත්මක නොකිරීම තුළින් රජයට සිදුවී ඇති පාඩු අදාළ වගකිව යුතු

වටිනාකම රු,107,796.837ක් වී තිබුණි. සියයට 50 ට වඩා වැඩ නිම කරන ලද කළ වැඩ වටිනාකම රු.52,787,337 ක් වූ කොන්ත්‍රාත් 14 ක්ද ඒ අතර විය. 2024 ජනවාරි 10 දිනැති අංක 01/2024 දරණ ජාතික අයවැය චක්‍රලේඛය මගින් ඉහත කි චක්‍රලේඛය අවලංගු කර තිබුණද එදිනට පසුව රු.180,951,202 ක් වූ ව්‍යාපෘති 20 ක්ද අවලංගු කර තිබුණි. මෙම කොන්ත්‍රාත් අවලංගු කරන අවස්ථාවේදී කොන්ත්‍රාත් 13 ක් සඳහා ලබාදී තිබූ රු.29,310,783 ක අත්තිකාරම් බැදුම්කරද කොන්ත්‍රාත් 14 ක් සඳහා ලබාදී තිබූ රු.6,346,593 ක්වූ කාර්යසාධන බැදුම්කරද කල් ඉකුත් වී තිබුණි.		නිළධාරීන්ගෙන් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය.

5. යහපාලනය

5.1 අභ්‍යන්තර විගණනය

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2019 ජනවාරි 12 දිනැති අංක DMA/01-2019 දරණ විගණන හා කළමණාකරන දෙපාර්තමේන්තු චක්‍රලේඛයෙහි 03 ඡේදය හා 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40 වන වගන්තිය ප්‍රකාරව ආයතනයට අභ්‍යන්තර විගණකයෙකු පත්කර නොතිබූ අතර 2020 වර්ෂයේ දෙපාර්තමේන්තුවට පත්කරන ලද අභ්‍යන්තර විගණන නිලධාරිනිය විධිමත් අනුමැතියකින් තොරව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් දෙපාර්තමේන්තුවේ ගණකාධිකාරී ලෙස 2021 වර්ෂයේ පත්කිරීම හේතුවෙන් එදින සිට එම තනතුර පුරප්පාඩුව පැවතුණි.	ලේකම්, නාගරික සංවර්ධන, ඉදිකිරීම් සහ නිවාස අමාත්‍යාංශය විසින් දෙපාර්තමේන්තුව සඳහා ප්‍රධාන අභ්‍යන්තර විගණකවරයකු ලබා ගැනීමට අදාළව ඉල්ලීම අංක DNCWS/ADM/05/01/VOL-ii හා 2025 අප්‍රේල් 03 දිනැති ලිපිය අධ්‍යක්ෂ ජනරාල්, කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.	සුදුසු අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා ආයතනයේ අභ්‍යත්තර පාලනය ශක්තිමත් කලයුතුය.

6. මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත, තථ්‍ය, ජ්‍යෙෂ්ඨ මට්ටමේ අනුමත තනතුරු 36 න් තනතුරු 18 ක් ඇතුලුව සියළුම කාණ්ඩවල පුරප්පාඩු සංඛ්‍යාව සියයට 21 ක පමණ ප්‍රතිශතයක් විය. ජ්‍යෙෂ්ඨ මට්ටමේ අනුමත තනතුරු 03 ක් සඳහා පූර්ණ කාලීන වැඩ බැලීමේ පත්වීම් 03 ක් සිදුකර තිබූ අතර අනුමත තනතුරු සඳහා කොන්ත්‍රාත් පදනම මත සේවකයින් 09 ක් බඳවාගෙන තිබුණි.	රාජ්‍ය සේවයට නව බඳවා ගැනීම් සීමා කිරීමත් සමඟ මෙතෙක් නිලධාරීන් අනුයුක්ත කර නොමැත. අධ්‍යක්ෂ ජනරාල් තනතුර සඳහා අමාත්‍ය මණ්ඩල තීරණයක් අනුව පූර්ණකාලීනව වැඩ බැලීම සඳහා පත් වීමක් සිදු කර ඇත. අධ්‍යක්ෂ (සැලසුම්) හා අධ්‍යක්ෂ (මෙහෙයුම් හා ඇගයුම්) වසරක කාලයක් දක්වා හෝ පුරප්පාඩු සම්පූර්ණ කරන දිනය යන දින දෙකෙන් පළමුව එළඹෙන දිනය දක්වා කාල සීමාව පවතින පරිදි රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පූර්ණකාලීනව වැඩ බැලීමට පත් කර ඇත.	දෙපාර්තමේන්තුවේ කාර්යමණ්ඩල අවශ්‍යතාවය නිසි පිරිදි හඳුනාගෙන අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කිරීමට හා අවශ්‍ය කාර්ය මණ්ඩලය බඳවා ගැනීම කළ යුතුය.